2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම: පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

වැය ශීර්ෂ අංක 09

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 (1) ඡේදය යටතේ වූ 2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානයන් ප්‍රකාර පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පිහිටුවා ඇත.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.2.1. දැක්ම

සේවා දායකයන්ගේ වෘත්තීයමය ගැටලුවලට පරිපාලනමය රෙගුලාසිවලට අනුව සාධාරණ ව විසඳුම් ලබා දීම.

1.2.2. මෙහෙවර

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ix වැනි පරිච්ඡේදයෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කරමින් රාජ්‍ය නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණයක් හෝ නියමයක් පිළිබඳව ගුණාත්මක සහ ස්වාධීන සමාලෝචනයක් සිදුකර පරිපාලනමය සාධාරණත්වය ඉටු කර දීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1.3.1 රාජ්‍ය නිලධාරින් සහ පොලිස් නිලධාරින් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් දෙනු ලබන තීරණයන්ට සහ නියමයන්ට එරෙහිව ගොනු කරනු ලබන අභියාචන විමර්ශනය කර විනිශ්චයන් ලබාදීම

1.3.2. අභියාචන භාර ගැනීම
2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ 4 (1) සහ 4(2) අනුව ඉදිරිපත් කළ යුතු ය.

1.3.3 අභියාචනයක් ලද පසු ගන්නා පියවර
එකී පනතේ 5(1) සහ 5(2) ක්‍රියාපරිපාටිය මූලික පියවර ගෙන 6(අ), (ආ), (ඇ), (ඈ) අනුව ක්‍රියා කිරීම

1.3.4 අදාල පනතේ 7 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභියාචනය ලැබී මාස 2 ක් ඇතුළත අවසන් වශයෙන් සුදුස්සක් කළ යුතු ය.

1.3.5 අදාල පනතේ 8(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නඩු විභාගය සිදු කරනු ලබන අතර 8(2) වගන්තියට අනුව එකී තීරණයක් අවසානාත්මක හා තීරණාත්මක වන අතර එය අධිකරණයක යම් නඩුවකදී හෝ නඩු කටයුත්තකදී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

1.4 සංවිධාන සටහන



පනතේ 2 වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සභාපතිතුමා ඇතුළු තිදෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් පත් කරනු ලැබේ.

2019.12.31 දිනට සංයුතිය:

සභාපති විනිසුරු එන්.ජී.දිසානායක මහතා
සාමාජික ජනාධිපති නීතිඥ ඒ.ඥාණදාසන් මහතා
සාමාජික ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික ජී.පී.අබේකීර්ති මහතා

ලේකම් කේ.බී.ඩී.එම්.පී.බී.දිසානායක මහතා
සහකාර ලේකම් එම්.රෆීක් ඉස්මායිල් මහතා

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

I. අභියාචන සම්බන්ධ ප්‍රගතිය - 2019.12.31 දිනට

2019.01.01 දිනට ඉදිරියට ගෙන ආ අභියාචන සංඛ්‍යාව		879
නැවත කැඳවූ අභියාචන සංඛ්‍යාව	33	
2019 වර්ෂය තුළ ලද අභියාචන සංඛයාව	505	538
කාලසීමාව තුළ විභාග කිරීමට තිබූ මුළු අභියාචන සංඛ්‍යාව		1,417
කාලසීමාව තුළ ඉල්ලීමට ඉඩදුන් අභියාචන සංඛ්‍යාව	163	
කාලසීමාව තුළ ඉල්ලා අස්කරගත් අභියාචන සංඛ්‍යාව	39	
නිෂ්ප්‍රභ කළ අභියාචන සංඛ්‍යාව	342	
අභියාචකගේ / රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ/ ජාතික පොලිස් කොමිෂන් සභාවේ ඉල්ලීම මත බහා තබන ලද අභියාචන සංඛ්‍යාව	20	
ඒ අනුව මෙම කාලසීමාව තුළ අවසන් කළ අභියාචන සංඛ්‍යාව		564
2019.12.31 දිනට අවසන් නොවූ 2020 වර්ෂයට ගෙන ගිය අභියාචන සංඛ්‍යාව		853

II. ඉදිරි දැක්ම

1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා පොලිස් කොමිෂන් සභාව හරහා ඉදිරිපත් කෙරෙන අභියාචන පිළිබඳව මේ වන විටත් ආරම්භකොට පවත්වාගෙන යනු ලබන කටයුතු නොපිරිහෙළා, නොවලහා යථාවත් කිරීම හා තවදුරටත් ඉදිරිපත් කෙරෙන අභියාචන සම්බන්ධයෙන් තත්ත්වාකාරයෙන් කටයුතු කිරීම.

2. 2018 අංත 19 දරන ජාතික විගණන පනත ප්‍රකාරව විගණන නිලධාරීන්ගේ අභියාචන ද විමසීමේ කටයුතු මෙම අධිකාරයට පැවරී ඇත. එහෙත් 2002 අංක 4 දරන අධිකාරය පිහිටුවීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව මෙම අභියාචන විමසීමේ බලය අධිකාරයට පැවරී නොමැති බැවින් පනත සංශෝධනය කර ගැනීම සඳහා දැනටමත් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ජනාධිපති ලේකම් කාර්යාලට භාර දී ඇත. ඒ පිළිබඳ අනුමැතිය ලද පසු ඉදිරිපත් වී ඇති විගණන නිලධාරීන්ගේ අභියාචන සම්බන්ධයෙන් විමසීම් කටයුතු ආරම්භ කිරීම

03 පරිච්ඡේදය - 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2019		සටහන	තත්‍ය 2019	තත්‍ය 2018	
-	**ආදායම් ලැබීම්**			-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	197,800	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		197,800	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		28,113,000	27,691,618	**ඒසීඒ-3**
-	තැන්පතු		-	-	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		-	-	
-	වෙනත් ලැබීම්			-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**28,113,000**	27,691,618	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**28,310,800**	27,691,618	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
15,395,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	15,302,216	13,491,915	ඒසීඒ-2(ii)
-	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	-	-	ඒසීඒ-2(ii)
-	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	-	-	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
12,850,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	12,643,939	12,777,019	
28,245,000	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**27,946,155**	26,268,934	

	මූලධන වියදම්				
250,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	-	-	එසීඒ-2(ii)
800,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	624,966	486,875	
-	ප්‍රාග්ධන පැවරීම්	**12**	-	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
25,000	හැකියා වර්ධනය	**14**	15,000	-	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
1,075,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**639,966**	486,875	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**570,084**	692,795	එසීඒ-4
	තැන්පතු ගෙවීම්		45,584	5,405	
	අත්තිකාරම් ගෙවීම්		524,500	687,390	
	මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)		28,258,593	* 27,448,604	
29,320,000.00	**2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඈ-උ)**		52,207	243,014	

* හරස් සටහන් අඩු කිරීමෙන් පසු (රු. 897,612.)

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-[illegible]

2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2019 රු.	2018 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	19,763,924	19,138,958
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	1,417,680	1,504,580
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	52,207	243,014
මුළු වත්කම්		**21,233,811**	**20,886,552**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		1,417,680	1,504,580
දේපළ පිරියත හා උපකරණ සංචිතය		19,763,924	19,138,958
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	52,207	243,014
මුළු වගකීම්		**21,233,811**	**20,886,552**

පිටු අංක 5 සිට 53 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 54 සිට 61 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තගර්ත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධමර්වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

…………………….	…………………….	M. R… Ismail……………………
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම : කේ. බී. [illegible] එම්. පී. බී. දිසානායක	නම : එම්. රෆීක් ඉස්මායිල්
තනතුර : [illegible] එස්. ඊ. දිසානායක	තනතුර : ලේකම්	
දිනය : සභාපති, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය	දිනය : පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය	දිනය : සහකාර ලේකම්, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

6

3.3 <u>මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය</u>

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තතය වර්තමාන වර්ෂය 2019 රු.	ඉකුත් වර්ෂය 2018 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	28,310,800	27,691,618
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**28,310,800**	**27,691,618**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	27,618,627	26,961,729
සහනාධාර සහ වියදම්	-	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**27,618,627**	**26,961,729**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**692,173**	**729,889**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**

<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	639,966	486,875
අත්තිකාරම් ගෙවීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**639,966**	**486,875**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(639,966)**	**(486,875)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඈ) + (ඊ)	**52,207**	**243,014**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**52,207**	**243,014**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. 000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය රු.	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.3.9900	වෙනත් ආදායම්	ඇස්තමේන්තු කළ නොහැක.	-	191,800.	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	27,900,000	28,245,000	27,946,155	99%
ප්‍රාග්ධන	1,075,000	1,075,000	639,967	60%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - **නැත.**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	2019.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2019.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	20,416,436	-	-
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ජේපිඒ/ඊ/ඒඒටී/2019/33 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2020 ජූනි 10 දින

ADMINISTRATIVE APPEALS TRIBUNAL
11 JUN 2020

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව .

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ භාෂාත්‍රයෙන් වූ මුල් පිටපත් මේ සමඟ එවා ඇත.

එම්.ජී.බී.ජී.පී ප්‍රනාන්දු
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත:අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. ජේපීඒ/ඊ/ඒඒටී/2019/33

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2020 ජුනි ... දින.

ADMINISTRATIVE APPEALS TRIBUNAL
11 JUN 2020

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අධිකාරය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අධිකාරයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව මා ප්‍රකාශ කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

1.6.1.1 **ආදායම් ලැබීම්**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ තැන්පතු ගෙවීම් වශයෙන් රු.45,584 ක් දක්වා ඇතත් ඒසීඒ-4 ආකෘතියෙහි තැන්පතු පිළිබඳ කිසිදු සටහනක් දක්වා නොතිබුණි.

1.6.1.2 **ආදායම් නොවන ලැබීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **අත්තිකාරම් ලැබීම්**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ රු.611,400 ක අත්තිකාරම් ලැබීම් දක්වා නොතිබුණි.

(ආ) **වෙනත් ලැබීම්**

(i) වෙනත් ලැබීම් යටතේ දැක්විය යුතු රු. 438,428 ක් දක්වා නොතිබුණි.

(ii) ආදායම් නොවන ලැබීම් ලෙස වෙනත් ලැබීම් යටතේ දැක්විය යුතු රු.197,800 ක් ආදායම් ලැබීම් ලෙස බදු නොවන ආදායම් හා වෙනත් යටතේ දක්වා තිබුණි.

1.6.1.3 මූලධන වියදම්

2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැය විෂයයේ රු.250,000 ක් වූ මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ ශේෂය රු.652,512 ක් අඩුවෙන් දැක්වීම නිසා දේපල පිරියත හා උපකරණ සංචිතයද එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.3.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ ආදායම් නොවන ලැබීම් දක්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ 9 (1) ඡේදය	අධිකාරයේ සභාපතිවරයා ,අධිකරණ සේවා කොමිෂන් සභාව විමසා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කළ යුතු වුවද නිලධාරීන් 5 දෙනෙකු අධිකරණ සේවා කොමිෂන් සභා අනුමැතිය මත සේවයේ යොදවා තිබුණු අතර එම කාලය අවසන් වීමෙන් පසු නැවත කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේදී කොමිෂන් සභාව විමසා නොතිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

(i)	2019 අප්‍රේල් 16 දිනැති අංක	නිලධාරීන්ගේ කාර්යාලයට පැමිණීම පිටවීම

	09/2009 දරන චක්‍රලේඛය	සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි.
(ii)	2018 පෙබරවාරි 2 දිනැති අංක 03/2018 දරන චක්‍රලේඛයේ 02 ඡේදය	තනතුරු 3 ක් සඳහා නිලධාරීන් තිදෙනෙකු වසර 02 කට වැඩිකාලයක් , තනතුරු 04 ක් සඳහා නිලධාරීන් තිදෙනෙකු වසර 05 කට වැඩි කාලයක් වශයෙන් විශ්‍රාමික නිලධාරීන් හයදෙනෙකු සේවයේ යොදවා තිබුණි.
(ඇ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) ඡේදය	සේවා ගිවිසුම් කාලය අවසන් වීමට පෙර ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කර නිසි කලට වේලාවට සේවා සැපයීම සඳහා ආයතන තෝරාගෙන නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය**

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ

එම්.ජී.බී.ජී.බී.ප්‍රනාන්දු
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක - **අදාල නොවේ.**

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හදුනාගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න. - අදාල නොවේ.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	02	02	-
තෘතියික	-	-	-
ද්විතියක	22	11	11
ප්‍රාථමික	08	06	02
එකතුව	32	19	13

6.2 පවතින සීමිත කාර්ය මණ්ඩලයට පුරප්පාඩු ද ආවරණය වන පරිදි ප්‍රායෝගික වශයෙන් යෝග්‍ය වන ආකාරයට රාජකාරි පවරා ඇති බැවින් අධිකාර කාර්යාලයීය රාජකාරි කටයුතු කෙරෙහි බලපෑමක් සිදු නොවීම.

6.3 මානව සම්පත් සංවර්ධන

වැඩසටහනේ නම	**පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව**	**වැඩසටහනේ කාල සීමාව**	**සමස්ථ ආයෝජනය රු. '000**		**වැඩසටහනේ ස්වභාවය (දේශිය / විදේශිය)**	**නිමැවුම් / ලබාගත් දැනුම**
			දේශිය	විදේශිය		
මූලික දෙමළ භාෂා පුහුණුව	02	මාස 06	15	-	දේශිය	දෙමල භාෂා ප්‍රවීණතා පරික්ෂණය සමත් වී ඇත.
සිගාස් වැඩසටහන	04	දින 01	-	-	දේශිය	සිගාස් වැඩසටහන ආයතනය තුළ ක්‍රියාත්මක කිරීම

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය	අනුකූල නොවේ නම් ඒ සදහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තිරණ ක්‍රියාමාර්ග
1	**පහත සදහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.2	වාර්ෂික මූල්‍ය ප්‍රකාශය	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන තනතුරක් අනුමත කාර්ය මණ්ඩලය තුල නොවේ.	ඒ සඳහා ලිපිකරු නිලධාරියෙකු යොදවා ඇත.
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (සිගාස්) පිළියෙල කර නියමිත දිනට මහ භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල නොවි.	බැරකම් නොතිබුණි.	බැරකම් ඇතිවුවහොත් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කිරීම.
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (ජීඒ එන් 20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබද ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල නොවේ	ගණකාධිකාරිවරයෙකු ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවේ.	සහකාර ලේකම්වරයා ගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		

4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	විශාල වශයෙන් මිලදී ගැනීම් සිදු නොවේ.	එවැනි සැලැස්මක් ප්‍රායෝගික නොවීම
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණකයෙකු නොමැති නිසා එවැනි සැලසුම් සකස් නොකිරීම	ඉදිරි වර්ෂය සඳහා සැලැස්මක් සකස් කිරීමට අදහස් කරමි.
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (එන්ඩීබී) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6.	**අභ්‍යන්තර විගණනය**	අදාල නොවේ.		
7.	**විගණන හා කළමනාකරණ කමිටු**	අදාල නොවේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ.	ගර්හිත කරන ලද භාණ්ඩ නොවීම	ගර්හිත භාණ්ඩ ඇති වුවහොත් මු.රෙ. 772 අනුව කටයුතු කිරීමට අදහස් කරමි.
9.	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ.	ගර්හිත වාහන නොවීම	අවශ්‍ය වුවහොත් එසේ කිරීමට අදහස් කිරීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		

9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසදුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	අක්‍රිය බැංකු ගිණුම් නොවීම	අක්‍රිය බැංකු ගිණුම් ඇති නොවීමට කටයුතු කිරීම
10.3	බැංකු සැසදුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළැඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිග හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල නොවේ.	කල් ඉකුත් වූ ණය ශේෂ නොවීම	හිග ණය ශේෂ වුවහොත් එසේ කටයුතු කිරීම
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල නොවේ	පොදු තැන්පත් ගිණුමක් නොවීම	
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	පොදු තැන්පත් ගිණුමක් නොවීම	
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම කරනු නොලැබේ.	එවැනි අවශ්‍යතාවක් වුවහොත් එපරිද කටයුතු කිරීම
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල නොවි.	තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම කරනු නොලැබේ.	එවැනි අවශ්‍යතාවක් වුවහොත් එපරිදි කටයුතු කිරීම
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**	අනුකූල නොවේ.	ආදායම් ගිණුමක් නැත.	
16.	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති එම්එස්ඩී චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු	අනුකූල වේ.		

	පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
17.2	ආයතන පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල නොවේ.	වෙබ් අඩවියක් ක්‍රියාත්මක නොවේ.	ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවති.
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	පුහුණුවීම් ලබා දී නැත.	
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 5/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්ම කර තිබිම	අනකූල නොවේ.	අධිකරණමය ක්‍රියාදාමයක් සිදුවන ආයතනයක් බැවින් මෙවැන්නක් ක්‍රියාත්මක කිරීමේ අපහසුතාව	ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගැයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබිම	අනුකූල නොවේ.	අධිකරණමය ක්‍රියාදාමයක් සිදුවන ආයතනයක් බැවින් මෙවැන්නක් ක්‍රියාත්මක කිරීමේ අපහසුතාව	ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රා.පරි.චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ.	සමස්ත කාර්ය මණ්ඩලය 19 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	සමස්ථ කාර්ය මණ්ඩල 19 ක් බැවින් ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහනා මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ.	සමස්ත කාර්ය මණ්ඩලය 19 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	සමස්ථ කාර්ය මණ්ඩල 19 ක් බැවින් ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවි.	සමස්ත කාර්ය මණ්ඩලය 19 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	සමස්ථ කාර්ය මණ්ඩල 19 ක් බැවින් ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල නොවේ.	සමස්ත කාර්ය මණ්ඩලය 19 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	සමස්ථ කාර්ය මණ්ඩල 19 ක් බැවින් ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		